# "ද ෆිනෑන්ස් " සමාගමෙන් ඔබගේ ඉඩම් ඔප්පුව ලබා ගන්නේ කෙසේද?

මේ වනවිටත් ඉඩම් සඳහා ණය ලබාගෙන මුදල් ගෙවා අවසන් වී ඇත්නම් ඒවාට නියමිත විකුණුම් ඔප්පු අංක 55, ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ 4 පිහිටි ද ෆිනෑන්ස් සමාගමේ ප්‍රධාන කාර්යාලයේ නොතාරිස් අංශයෙන් ලබාගත හැක.

(1) **අදාල ඔප්පුව ලබා ගැනීමට ඔබ කලයුත්තේ කුමක්ද?**

ද ෆිනෑන්ස් සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගේට්ටුවෙන් තබාඇති ඔප්පු පැවරුම් ඉල්ලුම් පත්‍රයක් ලබා ගෙන හෝ www.thefinance.lk යන වෙබ්අඩවිය වෙතින් ඉල්ලුම්පත්‍රයක් බාගත කොටගෙන එය 'ද ෆිනෑන්ස්' ආයතනයේ නොතාරිස් අංශය වෙත යොමු කරන්න. ඔබ විසින් සපයා ඇති ඔබ සමග සම්බන්ධ වියහැකි තොරතුරු අනුව එම අංශයේ නිලධාරින් ඔබ සමග සම්බන්ධ වනු ඇත.

(2) **ඉහත සඳහන් ඉල්ලුම්පත පිරවීම/සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු මොනවාද?**

ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ණය ගිවිසුම් අංකය, දුරකථන අංකය, ඉඩමේ නම, ලොට් අංකය, ලිපිනය සහ අදාල ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කල දිනය යනාදිය.

(3) **ඔබට අදාල ඔප්පුව ලබාගත හැක්කේ කවදාද?**

මේවනවිටත් අදාල මුද්දර ගාස්තු සහ අදාල විස්තර 'ද ෆිනෑන්ස්' ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත ලබාදී ඇති ඔප්පු සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන අතර අනෙක් ඔප්පු ඔබ විස්තර සපයනු ලබන පිළිවෙලට ලබාදීමට කටයුතු කරනු ඇත.

(4) **'ද ෆිනෑන්ස්' ආයතනය වෙතින් වැඩිදුර විස්තර ඔබ ලබා ගන්නේ කෙසේද?**

අපගේ ක්ෂණික දුරකථන අංක (Hot Line) 0112 597610 වෙත හෝ 'inquiry@thefinance.lk' විද්‍යුත් තැපැල මගින් ඔබට අවශ්‍ය තොරතුරු ලබාගත හැක. කාර්යාල වේලාවන්හි අංක 55, ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ 04 යන ලිපිනයේ පිහිටි ප්‍රධාන කාර්යාලයට පැමිණීමෙන්ද ඔබට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.